# අභාවයට යමින් පවතින කඩොලාන පරිසර ආශ්‍රිත සාම්ප්‍රදායික ජාකොටු ධීවර කර්මාන්තය සංචාරක ආකර්ෂණයක් ලෙස නගා සිටුවීම

යූ. එම්. ප්‍රබෝධා ලක්මිණි  පී. ඒ. සඳුනි තිලකරත්න*

සාම්ප්‍රදායික මෙන්ම තිරසාර ක්‍රමයක් ලෙස සැලකිය හැකි ජාකොටු කර්මාන්තය තුළින් ගොඩනැගුණු වර්තමාන ධීවර කර්මාන්තයේ ස්වභාවය පිළිබිඹු කිරීම අප අපේක්ෂා කරන අතරම එය සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ගයක් හෙළිදරව් කිරීමයි. ශ්‍රී ලංකාවේ ඉතාමත් තර්ජනයට ලක් වූ පරිසරයක් ලෙස අධික ජෛව විවිධත්වයක් සහිත ඉතා සුවිශේෂී පරිසරයක් ලෙස කඩොලාන පරිසර පද්ධතිය හඳුනාගත හැකිය. කිවුල්දිය ධීවර කර්මාන්තය කෙරෙහි මෙම පරිසර පද්ධතිය ඍජු ලෙසම බලපැම් කරනු ලබයි. ජාකොටු ලෙස හඳුන්වන්නේ විශේෂිත වූ මත්ස්‍ය උගුලකි. වර්තමානයේ බොල්ගොඩ ඔය හා මාදු ගඟ වැනි ස්ථානවල මෙම කර්මාන්තය අදටත් සිදුවේ. ඉස්සන් ඇල්ලීම සඳහා සම්පූර්ණයෙන්ම ගඟ හරහා ඉදිකරන වේල්ලක් ජාකොටු ලෙස හඳුන්වයි. මේ තුළට ඉස්සන් මෙන්ම වෙනත් මත්ස්‍යයන්ද හසුවෙයි. මෙයට මසුන්  ගාල් වූ විට මත්ස්‍යයන් වර්ධනය වීමට ඉඩ  ලැබේ. ජාකොටු නිර්මාණයකරණයේ ගඟ හරහා ඉන් සිටුවා පැළැල්ලක් සවි කිරීමෙන් මූලික ව්‍යුහයක් ගොඩනගයි. පැළැල්ල සවි කිරීමේ දී ගඟ දෙපස බෝට්ටු හා අනිකුත් ධීවර යාත්‍රා ගමන් කිරීමට හැකි වන පරිදි සවි කරයි. ජාකොටු තුළ මහා කාමරය, පුංචි කාමරය හා හිර කොටුව ලෙස කොටස් තුනකි. ජාකොටු තුළ රාත්‍රියට භූමිතෙල් පහනක් දැල්වීමෙන් ඉස්සන් ආලෝකයට ආකර්ෂණය වී ඒ දෙසට පැමිණි විට එහි හිරවී උගුලට හසුවේ. මාර්ගෝපදේශකයිනගේ නොදැනුවත්කම මෙම ජාකොටු සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහිලා පවතින පධ්‍රාන බාධාවකි. මේ ආශ්‍රිතව සංචාරක කර්මාන්තය නගා සිටුවීම සඳහා විවිධ සංචාරක ක්‍රියාකාරකම් දියත් කළ හැකිය. ජන ජීවිතයට ආවේණික ජාකොටු ආශ්‍රිත ක්‍රියාකාරකම් නැරඹීමට සංචාරකයෝ රුචිබවක් දක්වති. එමෙන්ම ජාකොටු තුළ රාත්‍රි කාලයට දල්වන භූමිතෙල් පහන් ආලෝකය තුළින් දක්නට ලැබෙන දර්ශනය ඉතා සුන්දරය, ඒ මනස්කාන්ත පරිසරයක නිර්මාණය කර ඇති මෙම ජාකොටු ආකර්ෂණීය නැරඹුමකි. තවද මේ ආශ්‍රිතව ආරක්ෂිත ආකාරයෙන් සියසබට වැනි ක්‍රියාකාරකම් දියත් කළ හැකිය. එසේම දිවා කාලයේ ජාකොටුවල හැසිරෙන මත්ස්‍ය චර්යාවන් දැක බලා ගැනීම සඳහා පතුල විනිවිද පෙනෙන බෝට්ටු නිර්මාණය කර යෙදවිය හැකිය. ප්‍රධාන ගැටලුවක් නම්, කඩොලාන පරිසර පද්ධතියටම බලපා ඇති පාරිසරික අක්‍රමිකතා නිසා ඉස්සන් බෝවීම අඩු වීම හා ඒ තුළින් ආදායම් අඩු කරයි. එබැවින් මේවා අවම කිරීමට නම් අවශ්‍ය පරිසර සංරක්ෂණ කටයුතු දියත් කළ යුතුය. තව ද ඒ තුළින් ඉස්සන් බෝවීම, වැඩිවීම හා එවිට ධීවර කර්මාන්තය දියුණු වී ආදායම් මට්ටද ඉහළ යයි. එසේම මෙම ජාකොටු අළුත් වැඩියා කිරීමට හෝ අලුතින්ම නිර්මාණයට විශාල මුදලක් වැය වන බැවින් මිනිසුන් මෙම ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් භාවිතයෙන් දුරස් කරයි. නමුත් මෙයට අවශ්‍ය මූල්‍යමය පත්‍රිපාදන රජය මැදිහත් වී ලබාදීම තුළින්ද මෙම ධීවර කර්මාන්තය දියුණු කර ගත හැකිය. සාම්ප්‍රදායික ජාකොටු ධීවර කර්මාන්තය වර්තමානයේ අභාවයට යමින් පැවතියද රජය මැදිහත් වී ඒවා අවම කිරීමට අවශ්‍ය කටයුතු කිරීමෙන් රටේ ආදායම් මාර්ගය ඉහළ නංවා ගත හැකිය.

ප්‍රමුඛ පද :- ජාකොටු, ධීවර කර්මාන්තය, පරිසරය, පහන්

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාල